# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
# பதிவாளர் நாயகம் திணைக்களம்
# REGISTRAR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ආර්ජී/එන්බී/01/චක්‍රලේඛ

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. } 565

ඔබේ අංකය / உமது இல. / Your No. }

234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.
234/A3, Denzil Kobbakaduwa Mawatha, Battaramulla.

දිනය / திகதி / Date } 2021.03. 18


චක්‍රලේඛ අංක : 04/2021

සියලුම කලාප භාර නියෝජ්‍ය/ සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් වෙත,

<u>නොතාරිස් විධිහීනතා සම්බන්ධයෙන් සමථ මුදල් අය කිරීම</u>

107 වන අධිකාරය වන නොතාරිස් ආඥා පනතේ 31(26) වගන්තියට අනුව නොතාරිස්වරයෙකු ලියා සහතික කරන ලේඛනවල දෙවන පිටපත් එම ලේඛනවල නාමාවලියක් සමග සෑම මසකම පහළොස්වන දින හෝ එදිනට පෙර අදාළ ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත භාර දිය යුතුවේ. යම් නොතාරිස්වරයෙකු එසේ නියමිත දිනට දෙවන පිටපත් භාර නොදෙන්නේ නම් එකී ආඥා පනතේ 34 වගන්තියට අනුව එම නොතාරිස්වරයාට විරුද්ධව නඩු පැවරීමේ හැකියාව ඇත. එම ආඥා පනතේ 35 වගන්තියට හා දෙපාර්තමේන්තු නියෝගයන්හි 15 වන වගන්තියට අනුව එසේ නඩු පැවරීම වෙනුවට සමථ කිරීමේ ගාස්තුවක් ලබාගෙන සමථ කිරීමේ බලයද රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට පවරා ඇත.

02. නඩු පැවරීම වෙනුවට මෙසේ පනවනු ලබන සමථ මුදල් නොතාරිස්වරුන්ගෙන් නිසි පරිදි අයකර ගැනීමේ දුෂ්කරතාවයක් පවතින බවට මා වෙත වාර්තා වී ඇත. මේ නිසා ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන්ට විගණන විමසුම්වලට ලක්වීමටද සිදුවී ඇත.

03. ඉහත කරුණු සැලකිල්ලට ගෙන නොතාරිස් ආඥා පනතේ 31(26) වගන්තියට අනුව නොතාරිස්වරුන් දෙවන පිටපත් නිසි පරිදි භාර නොදීම සම්බන්ධයෙන් අයකළ යුතු සමථ මුදල් පිළිබඳව මෙම චක්‍රලේඛය නිකුත් කරන අතර සමථ මුදල් අයකිරීම සම්බන්ධව මීට පෙර මා විසින් නිකුත් කරන ලද අංක RG/NB/1/විගණන විමසුම් හා 2013.01.10 සහ 2013.04.22 දිනැති ලිපි මෙයින් අවලංගු කරමි.

04. මින් ඉදිරියට සමථ මුදල් අයකිරීම සම්බන්ධයෙන් වන සියලුම කටයුතු සිදු කිරීමේ බලය කලාප භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් වෙත පවරමි. පහත සඳහන් ආකාරයට අවමය රු 200/ ක් වන අතර උපරිමය රු 10,000/- කට යටත්වනසේ සමථ මුදල් අය කිරීමට කටයුතු කරන ලෙස දන්වමි.

| වැරදි ගණන | දෙවන පිටපතට අලවා ඇති මුද්දරවල වටිනාකමෙන් අය කළ යුතු සමථ මුදල | අය කළ හැකි උපරිම සමථ මුදල (රු) |
|---|---|---|
| 01 - 20 | 1% | 1,000/- |
| 21 - 40 | 3% | 3,000/- |
| 41 - 60 | 5% | 5,000/- |
| 61 - 100 | 7% | 7,000/- |
| 100 ට වැඩි | 10% | 10,000/- |


දුරකථන අංකය / தொலைபேசி இல. / Telephone No. } 2889488 / 2889489

ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No. } 2889491

වෙබ් අඩවිය / இணையத்தளம் / Website } www.rgd.gov.lk

විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail } rgd@sltnet.lk / rg@rgd.gov.lk

05. නොතාරිස් ආඥා පනතේ 31(2) වගන්තියට අනුව නොතාරිස්වරයා විසින් නියමිත පරිදි මාසික ලැයිස්තුව භාර දී ඇති නමුත් එම ලැයිස්තුවේ සඳහන් සමහර ලේඛන භාර නොදුන් අවස්ථාවන්හිදී, එසේ ප්‍රමාද වී භාරදෙන ලේඛන සඳහා නියමිත මුද්දර ගාස්තුව නිසි පරිදි ගෙවා තිබේ නම්, එම ලේඛන සම්බන්ධයෙන් කාලය හෝ විධිහීනතා ප්‍රමාණය නොසලකා රු 1,000/- ක සමථ මුදලක් පමණක් අය කිරීමට පියවර ගත යුතුය. එසේ ප්‍රමාද වී දෙවන පිටපත් කිහිපයක් භාර දෙන විට මුලින්ම එම මාසයට අදාළ දෙවන පිටපත් භාර දුන් මාසික ලැයිස්තුවේ පිටපතක්ද සමග භාර ගැනීමට කටයුතු කළ යුතුය.

06. වැරදි ගණන 20 ඉක්මවා ඇති විටක, ප්‍රමාද වී භාරදෙන ලද මාසික වාර්තාවේ සියලු ලේඛන මුද්දර ගාස්තුවලින් නිදහස් වන අවස්ථාවකදී හෝ හිස් වාර්තා භාරදීම පුරුද්දක් වශයෙන් ප්‍රමාද කරන අවස්ථාවකදී රු 1,000/- ක උපරිමයකට යටත්ව සුදුසු සමථ මුදලක් අයකිරීමට කටයුතු කළ යුතුය

07. සමථ මුදල් අයකර ගැනීම සඳහා ලියාපදිංචි තැපැල් මාර්ගයෙන් නොතාරිස්වරයා වෙත දැනුම් දිය යුතු අතර එසේ සමථ මුදල් පනවන ලද බවට ඉඩම් රෙජිස්ට්‍රාර් විසින් දැනුම් දෙන ලද දින සිට දින 30 ක් තුළ සමථ මුදල් ගෙවිය යුතු වේ.

08. නොතාරිස්වරයා විසින් සමථ මුදල් ගෙවීම පැහැර හරින්නේ නම් නොතාරිස් ආඥා පනතේ 34 වගන්තියෙහි සඳහන් විධිවිධාන පරිදි නොතාරිස්වරයාට එරෙහිව නඩු පැවරීමට කටයුතු කළ යුතුය.

09. නඩු පැවරීමෙන් අනතුරුව අධිකරණය මගින් ලබාදෙන නියෝගය ඔබගේ නොතාරිස් පරීක්ෂණ ලේඛණයෙහි (NCB) හා සමථ මුදල් ලේඛනයෙහි ඇතුළත් කර රෙජිස්ට්‍රාර්ගේ අත්සන හා දිනය යෙදිය යුතු වේ.

10. 2021.04.01 දින සිට ඉහත සඳහන් නියෝගය හා උපදෙස් අනුව කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

ඩබ්ලිව්.එම්.එම්.බී. වීරසේකර
රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත්: 01. සියලුම දිස්ත්‍රික් භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - කාරුණික දැ.ගැ.ස

02. ප්‍රධාන කාර්යාලයේ සියලුම මාණ්ඩලික නිලධාරීන් - කාරුණික දැ.ගැ.ස